**පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන
-------------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් සටහන් අනුව උපචිත පදනම හා මුදල් පදනම අනුගමනය කළ ආදායම් වියදම් විෂයයන් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) තොග අගය කිරීමේ පදනම ගිණුම් සටහන්වලින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.192,020 ක් වූ ආයුර්වේද ඖෂධ තොගය ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.3 නොසැසඳුණු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 3 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛනවල ශේෂ අතර රු.182,451 ක නොසැසඳීම් පැවතුණි.

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

(අ) ලැබියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.147,141,487 ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂවලින් රු.26,376,186 ක් වර්ෂයකට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.128,560,752 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවලින් රු.22,306,971 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 121,482,001 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය | 170,000 | (i) සභා බල ප්‍රදේශයේ තිබෙන දුරකථන කුළුණු වෙනුවෙන් පෙරසැරි ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| | 132,000 | (ii) සභා අනුමැතිය ලැබී තිබුණු දුරකථන කුළුණු 21 ක අනුකූලතා ගාස්තු අයකරගෙන නොතිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,420,109 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.56,603,856 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 3,424 | 3,776 | 2,387 | 156 | 2,966 | 3,764 | 2,214 | 754 |
| (ii) බදු කුලී | 22,442 | 24,439 | 16,824 | 99 | 32,036 | 29,313 | 14,305 | 180 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,108 | 1,306 | 1,296 | 6 | 1,015 | 1,196 | 1,196 | - |
| (iv) වෙනත් ආදායම් | 111,084 | 91,756 | 75,097 | 50,130 | 102,214 | 125,100 | 80,993 | 44,107 |
| එකතුව | 138,058 | 121,277 | 95,604 | 50,391 | 138,231 | 159,373 | 98,708 | 45,041 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-----------------------------------**

සමාලෝචිත වර්ෂයට බිල්කළ රුපියල් මිලියන 121 කින් සහ ඉකුත් වර්ෂවල හිඟ රුපියල් මිලියන 45 කින්, රුපියල් මිලියන 96 ක් අයකරගෙන තිබුණු අතර, ඉන් රුපියල් මිලියන 28 ක් ඉකුත් වර්ෂවලට අදාළ හිඟ ලැබීම් විය. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 45 ක් වූ හිඟය සමාලෝචිත වර්ෂය අවසානයට රුපියල් මිලියන 50 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

**-----------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.91,956 ක් වූ වරිපනම් හිඟයෙන් රු.1,000 ට වැඩි හිඟ පවතින ඒකක 27 කින් රු.66,260 ක් අයවීමට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ජල ගාස්තු හිඟය රු.708,689 ක් වූ අතර විසන්ධි කළ ජල ඒකක 15 කට අදාළ රු.125,387 ක හිඟයක් පැවතුණි.

(ඇ) ව්‍යාපාර ඒකක 34 කට අදාළව රු.48,000 ක ව්‍යාපාර බදු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 (4) ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**---------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.8,721,589 ක් හා රු.36,413,507 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කාර්යසාධනය**

**---------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා සභාව විසින් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් අමාත්‍යවරයා විසින් සාදන ලද පොදු අතුරු ව්‍යවස්ථා සභාව විසින් වැළඳගෙන තිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

--------------------------------------------

ඇස්තමේන්තු වටිනාකම රු.3,310,247 ක් වූ ජල ව්‍යාපෘති දෙකක කටයුතු 2017 දෙසැම්බර් වනවිටත් නිමකර නොතිබුණි.

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්

-----------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව රු.13,370,108 ක් වූ කර්මාන්ත 22 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

සමාලෝචිත වර්ෂයට ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ රු.5,010,559 ක ප්‍රාග්ධන වියදමක් සිදුකර තිබුණු අතර, වර්ෂය තුළ කසළ ටොන් 2015 ක් රැස්කර දිරන කසළ භාවිතා කර කොම්පෝස්ට් කිලෝ ග්‍රෑම් 23,575 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්වී තිබුණු අතර දිළිඳුකම පිටුදැකීම අරමුණු කරගෙන පසුගාමී හුදකලා ගම්මාන සංවර්ධන ව්‍යාපෘති, කාන්තා අභිවෘද්ධි වැඩසටහන් සහ මාතෘ හා ළදරු පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**-----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හෙට්ටිපොල බස් නැවතුම්පල කඩ කාමර 04 කින් රු.5,516,737 ක් වූ පෙර ගෙවුම් මුදල් 2017 දෙසැම්බර් 31 දින වන විටද අයවිය යුතුව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීමට අපේක්ෂිත කර්මාන්ත ලැයිස්තුවක් සකස් කිරීමකින් තොරව ග්‍රාම නිලධාරී කොට්ඨාශයකට රු.400,000 බැගින් සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් ඇස්තමේන්තු කර තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**-------------------------------**

වර්තමානය වන විට සභාවේ සේවයේ නොමැති 21 දෙනෙකුගෙන් රු.359,289 ක් අයකරගත යුතුව පැවතුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අවම මාසික කුලිය රු.71,250 ක් වූ කඩ කාමර 06 ක් 2017 වර්ෂයේදී කුලියට දී නොතිබුණි.

(ආ) රු.1,950 මාසික කුලී අය කරන කඩ කාමර 04 ක නව තක්සේරු අනුව කඩකුලී අයකර ගැනීමට සහ ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂිකව සභා අරමුදල්වලින් නඩත්තු කරනු ලබන සුසාන භූමි 143 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව පාවිච්චි කරනු ලබන කැබ් රථයක් ප්‍රධාන ලේකම්ගෙන් පවරාගෙන නොතිබුණි.

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 සැපයීම් හා සේවා

කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කර තිබුණද, ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ට වැඩි ප්‍රමුඛතාවයක් ලබාදී තිබුණි.

### 3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මළගනේ වලව්වත්ත පළමු පටුමග රු.610,345 කින් කුට්ටිගල් අතුරා සංවර්ධනය කර තිබුණද මාර්ගයේ මීටර් 3x2.8 ක පමණ ප්‍රමාණයක කුට්ටිගල් ගිලා බැස තිබුණු අතර, රු.28,114 ක් වැයකර මාර්ගයේ දෙපස අතුරා තිබුණු බොරළු සෝදාගෙන ගොස් තිබුණි.

(ආ) ගිවිසුම්ගත වටිනාකම රු.3,602,730 ක් මත ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදි කිරීම 2017 අගෝස්තු 30 දිනට අවසන් කළ යුතු වුවද, 2017 දෙසැම්බර් 12 දින වන විටද ඉදිකිරීම් නිමකර නොතිබුණු අතර රු.94,571 ක් වූ ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

ආදායම් හා වියදම් විෂයයන් 06 ක අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර, සියයට 15 සිට සියයට 100 දක්වා ප්‍රමාණාත්මක විචලතාවයක් සිදුවී තිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
| --- | --- | --- |
| (අ) ආදායම් පාලනය | | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) පොත්පත් හා ලේඛන නොපැවැත්වීම | | ඔප්පු පැවරුම් සහතික නොමැති ඉඩම් ගොඩනැගිලි හා සුසාන භූමි සඳහා ඔප්පු ලබාගෙන නොතිබීම. |
| (ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු නොකිරීම. |
| (ඈ) අයවැය පාලනය | (i) | අයවැය විචලනයන් පැවතීම. |
| | (ii) | ඉදි කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ලැයිස්තුවක් ඇතුළත් නොකිරීම. |
| (ඉ) කොන්ත්‍රාත් පරිපාලනය | (i) | වැය කරන මුදලට ප්‍රතිලාභ ලැබී නොතිබීම. |
| | (ii) | මාර්ග සංවර්ධන කටයුතුවල අධීක්ෂණය දුර්වල වීම. |